# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2361/53 - 2023 දෙසැම්බර් මස 09 වැනි සෙනසුරාදා - 2023.12.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ යොමු අංකය : Bu/Ln/1/1/37.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4-3/6/2017/HW/342.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය, පහත දැක්වෙන ඉඩම්/ පරවශතාවට ලබා ගැනීමට රජය අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය :-*

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇගල්ඔය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද කැඩැස්තර සිතියම් අංක 530414 කලාප අංක 04, පත්‍ර අංක 1 හි ඉඩම් කැබලි අංක 1,2,3,4,5 හි සඳහන් මානානගොඩැල්ල හා දවටගහගොඩැල්ල ඉඩමේ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 0.0143 හි මායිම් පහත දැක්වේ.

01. **කැබලි අංක 01**

ඉඩමේ නම : දවටගහගොඩැල්ල; ඉඩමේ විස්තරය : උතුරට : මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) ; නැගෙනහිරට : ජී. ටී. මල්ලිකා ලතා හිමිකම් කියන දවටගහගොඩැල්ල (හි.පි. 236335); දකුණට : ජී. ටී. මල්ලිකා ලතා හිමිකම් කියන දවටගහගොඩැල්ල (හි.පි. 236335) සහ මෙම පිඹුරෙහි කැබලි අංක 2; බටහිරට : කැබලි අංක 2 සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0007.

02. **කැබලි අංක 02**

ඉඩමේ නම : මානානෙගොඩැල්ල, දවටගහගොඩැල්ල; ඉඩමේ විස්තරය : උතුරට : මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ මෙම පිඹුරෙහි කැබලි අංක 1; නැගෙනහිරට : කැබලි අංක 1, ජී. ටී. මල්ලිකා ලතා හිමිකම් කියන දවටගහගොඩැල්ල(හි.පි. 236335) ජී. ටී. මල්ලිකා ලතා හිමිකම් කියන මානානගොඩැල්ල (හි.පි. 144092) සහ මෙම පිඹුරෙහි කැබලි අංක 5 ; දකුණට : ජී. ටී. මල්ලිකා ලතා හිමිකම් කියන දවටගහගොඩැල්ල (හි.පි. 236335) ජී. ටී. මල්ලිකා ලතා හිමිකම් කියන මානානගොඩැල්ල (හි.පි. 144092) සහ මෙම පිඹුරෙහි කැබලි අංක 5,4,3; බටහිරට : කැබලි අංක 3 සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0115.

03. **කැබලි අංක 03**

ඉඩමේ නම : මානානෙගොඩැල්ල; ඉඩමේ විස්තරය : උතුරට : මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ මෙම පිඹුරෙහි කැබලි අංක 2; නැගෙනහිරට : කැබලි අංක 2,5 සහ 4; දකුණට : කැබලි අංක 4 සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); බටහිරට : මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); ප්‍රමාණය : හෙක්ටයාර් 0.0012.

04. **කැබලි අංක 04**

ඉඩමේ නම : මානානෙගොඩැල්ල, දවටගහගොඩැල්ල; ඉඩමේ විස්තරය : උතුරට : කැබලි අංක 3,2 සහ 5; නැගෙනහිරට : කැබලි අංක 5 සහ ජී. ටී. මල්ලිකා ලතා හිමිකම් කියන දවටගහගොඩැල්ල (හි. පි. 236335); දකුණට : මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); බටහිරට : මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ මෙම පිඹුරෙහි කැබලි අංක 3; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0002.

05. **කැබලි අංක 05**

ඉඩමේ නම : මානානෙගොඩැල්ල, දවටගහගොඩැල්ල; ඉඩමේ විස්තරය : උතුරට : කැබලි අංක 2; නැගෙනහිරට : ජී. ටී. මල්ලිකා ලතා හිමිකම් කියන මානානගොඩැල්ල (හි. පි. 144092) සහ ජී. ටී. මල්ලිකා ලතා හිමිකම් කියන දවටගහගොඩැල්ල (හි. පි. 236335); දකුණට : ජී. ටී. මල්ලිකා ලතා හිමිකම් කියන මානානගොඩැල්ල (හි. පි. 144092) ජී. ටී. මල්ලිකා ලතා හිමිකම් කියන දවටගහගොඩැල්ල (හි. පි. 236335) සහ මෙම පිඹුරෙහි කැබලි අංක 4; බටහිරට : කැබලි අංක 4, 3 සහ 2; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0007.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තමතමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024 ජනවාරි මස 10 වැනි දින පෙරවරු 10.00ට බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2024 ජනවාරි මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ඉඩමට/ පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**පී. ආර්. ප්‍රසාද් පෙරේරා,**
ප්‍රාදේශීය ලේකම්,
බුලත්සිංහල.

2023 නොවැම්බර් මස 30 වැනි දින,
බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
බුලත්සිංහල.

EOG 12-0131

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත** *(***460** *වැනි පරිච්ඡේදය)*

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය : DIVPP/LAND/LA/ACQUI/10/8/11.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4-3/18/2019/WS/402.

පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම අත්කර ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:-*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 354, පොල්පිතිගම ග්‍රාම නිලධාරි වසමේ ගලපිටගම ගමෙහි, ක.සි. 421484, කලාප අංක 01 පත්‍ර 1 හි 2023.10.30 දින පහත සඳහන් කර ඇති ඉඩම් කැබැල්ල:

01. **කැබලි අංක 01**

ඉඩමේ නම : බඹරගලපාවුලහේන්යාය, ගලපිටගමහේන, ගලපිටගමවැව, පන්සල්වත්ත; විස්තරය : ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය : රජය ; මුල් හිමිකම්පාන්නා : නාගොල්ල පුරාණ රජමහා විහාරය ; ප්‍රමාණය : හෙක්. 0.0513.

ඉහත සඳහන් ඉඩම් කැබැල්ල සඳහා හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2024.01.31 වැනි දින පෙරවරු 10.00ට පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2024.01.17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් 2ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**ඩී. එම්. එස්. දසනායක,**
ප්‍රාදේශීය ලේකම්,
පොල්පිතිගම.

2023 දෙසැම්බර් මස 05 වැනි දින,
පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
පොල්පිතිගම.

EOG 12-0132

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත** *(***460** *වැනි පරිච්ඡේදය)*

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ යොමු අංකය : BD/HE/LND/5/56.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4-3/9/2015/WS/94.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය, පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට රජය අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :-*

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහිවින්න කෝරළයේ, 55 ඇටම්පිටිය ග්‍රාම නිලධාරි වසමේ, ඇටම්පිටිය ගමේ මැනුම්පති විසින් පිළියෙල කරන ලද අ. කැ. සි. 710319 කලාප අංක 01 පත්‍ර

අංක 1 හි කැබලි අංක 1, 2 සහ 3 දක්වා දැක්වෙන ඉඩම් අතරින් මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2529ක් වූ පහත විස්තර සඳහන් ඉඩම් කැබලි තුනක්. (03).

01. **කැබලි අංක 01**
ඉඩමේ නම : අළුබෝමුල්ල කන්ද ඇටම්පිටිය වත්ත; ඉඩමේ විස්තරය : ගෙවත්ත ස්ථිර ගොඩනැගිලි 7ක්, වතුර ටැංකියක් සහ තාවකාලික මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන්නා : ඇටම්පිටිය වත්ත මල්වත්ත වැවිලි සමාගම; උතුරට : අ. ග. පි. 197 හි කැබලි අංක 29; නැගෙනහිරට : අ. ග. පි. 197 හි කැබලි අංක 29; දකුණට : අ. ග. පි. 197 හි කැබලි අංක 29 සහ කැබලි අංක 2; බටහිරට : අ. ග. පි. 197 හි කැබලි අංක 29; ප්‍රමාණය : හෙක්ටයාර් 0.2180

02. **කැබලි අංක 02**
ඉඩමේ නම : අළුබෝමුල්ල කන්ද ඇටම්පිටිය වත්ත; ඉඩමේ විස්තරය : මාර්ගය; හිමිකම් කියන්නා : ඇටම්පිටිය වත්ත මල්වත්ත වැවිලි සමාගම; උතුරට : අ. ග. පි. 197 හි කැබලි අංක 29 සහ කැබලි අංක 1; නැගෙනහිරට : කැබලි අංක 1 සහ අ. ග. පි. 197 හි කැබලි අංක 29 ; දකුණට : අ. ග. පි. 197 හි කැබලි අංක 29 සහ කැබලි අංක 3; බටහිරට : අ. ග. පි. 197 හි කැබලි අංක 29; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0246.

03. **කැබලි අංක 03**
ඉඩමේ නම : අළුබෝමුල්ල කන්ද; ඉඩමේ විස්තරය : මාර්ගය; හිමිකම් කියන්නා : රජය; උතුරට : අ. ග. පි. 197 හි කැබලි අංක 29 N1, 29 සහ කැබලි අංක 2; නැගෙනහිරට : අ. ග. පි. 197 හි කැබලි අංක 29; දකුණට : අ. ග. පි. 197 හි කැබලි අංක 29 සහ ගල්කුඩුහේන කඳුර සහ හින්නාරංගොල්ල (කොටසක්); බටහිරට : අ. ග. පි. 197 හි කැබලි අංක 29 N1; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0103

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තමතමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ පහත සඳහන් දිනයන්හි, ඒ ඒ ඉඩම් කැබලි සඳහා පහත නියමකර ඇති වේලාවට හැලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

| පරීක්ෂණ දින | වේලාව | කැබලි අංක |
|---|---|---|
| 2024.01.24 | පෙ.ව. 10.00 | 1, 2, 3 |

තවද, 2024.01.17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් 2ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**ඩී. එම්. සී. වීරසිංහ,**
ප්‍රාදේශීය ලේකම්,
හාලිඇල.

2023 දෙසැම්බර් මස 06 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
හාලිඇල.

EOG 12-0133

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.